248302

AL/2020/12/S (NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus)

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

NEW

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

සාමාන්‍ය පොදු පරීක්ෂණය
பொதுச் சாதாரணப் பரீட்சை
Common General Test

**12** **S**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**
- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිලිමත් ව කියවන්න.
- **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරා ගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (×) **යොදා දක්වන්න.**

**1.** 2019 ජූලි මාසයේදී, රටෙහි පැවති ඒක පුද්ගල දළ ජාතික ආදායම පදනම් කරගෙන ලෝක බැංකුව විසින් ශ්‍රී ලංකාව පහත දැක්වෙන එක් ආදායම් ප්‍රවර්ගයක් තුළ පිහිටුවන ලදී. නිවැරදි ප්‍රවර්ගය තෝරන්න.

(1) පහළ - මැදි ආදායම්
(2) ඉහළ - මැදි ආදායම්
(3) සාමාන්‍ය - මැදි ආදායම්
(4) අඩු - ඉහළ ආදායම්
(5) මැදි - ඉහළ ආදායම්

**2.** 2019 ජුනි මාසයේදී අභ්‍යවකාශයෙහි කක්ෂ ගත කරන ලද, ශ්‍රී ලංකාවේ ප්‍රථම පර්යේෂණ චන්ද්‍රිකාවෙහි නම කුමක් ද?

(1) රාවණා I (2) රෝහිණී I (3) කල්පනා I (4) රාමායන I (5) රාක්ෂස I

**3.** 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාව සංචාරක කටයුතු සඳහා ලෝකයේ අංක එකේ රට වශයෙන් ශ්‍රේණිගත කරන ලද ලෝක ප්‍රසිද්ධ සඟරාව කුමක් ද?

(1) ටයිම් (Time)
(2) ඩිස්කවරි (Discovery)
(3) ලෝන්ලි ප්ලැනට් (Lonely Planet)
(4) ද ඉකොනොමිස්ට් (The Economist)
(5) නැෂනල් ජියෝග්‍රැෆික් (National Geographic)

**4.** කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) යනු මීට පෙර මිනිසුන් තුළ ඇතැයි හඳුනාගෙන නොතිබුණු නව වෛරසයක් නිසා ඇතිවුණු වසංගත රෝගයකි. එය මුල් වරට වාර්තා වූ චීන නගරයේ නම කුමක් ද?

(1) වුහාන් (2) හාර්බින් (3) කුන්මිංග් (4) නැන්ජිංග් (5) යින්චුආන්

**5.** ශ්‍රී ලංකාව විසින් 2019 දෙසැම්බර් මස තායිලන්තයේදී දිනාගන්නා ලද 19න් පහළ ක්‍රීඩා ශූරතාව කුමක් ද?

(1) ආසියානු පිරිමි වොලිබෝල් ශූරතාව
(2) ආසියානු ක්‍රිකට් කවුන්සිල ශූරතාව
(3) ආසියානු පාපන්දු සන්ධාන ශූරතාව (AFC)
(4) ආසියා රග්බි පළමු කාණ්ඩ ශූරතාව (Division I)
(5) ආසියා රග්බි දෙවන කාණ්ඩ ශූරතාව (Division II)

**6.** ඉන්දීය පාර්ලිමේන්තුව අසල්වැසි රටවල් තුනකින් පැමිණි සුළුතර ආගමික සංක්‍රමණිකයන් සඳහා ඉන්දීය පුරවැසිභාවය පිරිනැමීමේ පනතක් 2019 දෙසැම්බර් මාසයේදී සම්මත කළේය. එම රටවල් තුන මොනවා ද?

(1) බංග්ලාදේශය, ඇෆ්ගනිස්ථානය සහ ශ්‍රී ලංකාව
(2) බංග්ලාදේශය, ඇෆ්ගනිස්ථානය සහ නේපාලය
(3) පකිස්ථානය, බංග්ලාදේශය සහ ශ්‍රී ලංකාව
(4) පකිස්ථානය, බංග්ලාදේශය සහ නේපාලය
(5) පකිස්ථානය, බංග්ලාදේශය සහ ඇෆ්ගනිස්ථානය

**7.** 2020 ජනවාරි මාසයේදී විශේෂ සූර්යග්‍රහණයක් ශ්‍රී ලංකාවට දර්ශනය විය. විද්‍යාඥයින්ට අනුව, මෙවැනි සූර්යග්‍රහණයක් ඊළඟට ශ්‍රී ලංකාවට දර්ශනය වන්නේ 2031 මැයි මාසයේදී ය. මෙම සූර්යග්‍රහණ වර්ගය කුමක් ද?

(1) උප (2) පූර්ණ (3) ආංශික (4) දෙමුහුන් (5) වලයාකාර

[දෙවැනි පිටුව බලන්න.

**8.** ශ්‍රී ලංකාවේදී සැලසුම් කර නිෂ්පාදනය කරන ලද Vega EVX (වේගා EVX) නමැති මෝටර් රථයක් 2020 මාර්තු මාසයේදී ස්විට්සර්ලන්තයේ ජිනීවා ජාත්‍යන්තර මෝටර් රථ ප්‍රදර්ශනයේදී නිල වශයෙන් හඳුන්වා දෙන ලදී. Vega EVX යනු,

(1) දෙමුහුන් මෝටර් රථයකි.
(2) පූර්ණ විද්‍යුත් සුපිරි මෝටර් රථයකි.
(3) ෆෝමියුලා වර්ගයේ තරග මෝටර් රථයකි.
(4) හයිඩ්‍රජන් මගින් ධාවනය වන මෝටර් රථයකි.
(5) ක්‍රීඩා උපයෝගිතා රථයකි. (SUV)

**9.** පැරිස්හි පිහිටි ලෝක ප්‍රසිද්ධ දෙව්මැදුරක් 2019 වර්ෂයේදී ගිනිගෙන දැඩි අලාභහානිවලට ලක් විය. එම දෙව්මැදුරෙහි නම කුමක් ද?

(1) නෝත්‍ර දාම් දෙව්මැදුර (2) කොලොංග් දෙව්මැදුර
(3) කැන්ටර්බරි දෙව්මැදුර (4) ශාන්ත පාවුළු දෙව්මැදුර
(5) ශාන්ත පැට්‍රික් දෙව්මැදුර

**10.** 2020 පෙබරවාරි මාසයේදී පැවති එක්සත් ජාතීන්ගේ මණ්ඩලයෙහි අන්තර් රාජ්‍ය ආයතනයක 43 වන සැසිවාරයේදී "40/1 යෝජනාවෙහි සම අනුග්‍රාහකත්වයෙන්" ශ්‍රී ලංකාව ඉල්ලා අස්විය. එම ආයතනයේ නම කුමක් ද?

(1) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය
(2) එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජයීය සභාව
(3) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)
(4) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය
(5) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO)

**11.** ඕවර 50 ක්‍රිකට් තරගයක් ජය ලැබීමේ ඉලක්කය ලකුණු 309කි. 10 වන ඕවරය අවසානයේදී ලකුණු ලැබීමේ වේගය 4.5 ක් විය. ඉතිරි ඕවර 40 දී ඉලක්කයට ළඟාවීම සඳහා අවශ්‍ය වන අවම ලකුණු ලැබීමේ වේගය කුමක් ද?

(1) 6.4 (2) 6.5 (3) 6.6 (4) 7.5 (5) 7.6

**12.** පැයට කිලෝමීටර 60 ක වේගයෙන් ධාවනය වන මීටර 200 ක් දිග දුම්රියක්, උමගක් පසුකිරීමට තත්පර 30 ක් ගනියි. උමඟෙහි දිග මීටර කීය ද?

(1) 270 (2) 290 (3) 300 (4) 310 (5) 320

**13.** අනුර එක්තරා මුදලක්, මුල් වර්ෂ දෙකේදී වාර්ෂිකව 6% ක ද ඊළඟ වර්ෂ තුනේදී වාර්ෂිකව 5% ක ද අවුරුදු පහෙන් පසුව වාර්ෂිකව 4% ක ද සුළුපොළී අනුපාතික යටතේ ණයට ගත්තේය. අවුරුදු 10 ක් අවසානයේදී ඔහු ගෙවන ලද මුළු පොළී මුදල රු. 11 750 නම්, අනුර කොපමණ මුදලක් ණයට ගත්තේ ද?

(1) රු. 23 500 (2) රු. 24 000 (3) රු. 24 500 (4) රු. 25 000 (5) රු. 25 500

**14.** පර්චසයකින් රු. 8 000 බැගින් ලාභ උපයන සේ විකිණීමේ අරමුණෙන් සිල්වා මහතා ඉඩම් කැබැල්ලක් මිලට ගත්තේය. පර්චසයක් සඳහා රු. 34 000 බැගින් ගෙවීමට කැමති මිලදීගන්නකු සිටියත්, එම මුදල, සිල්වා මහතා පර්චසයක් සඳහා ගෙවූ මුදලට වඩා 15% කින් අඩු ය. සිල්වා මහතා පර්චසයක් සඳහා අපේක්ෂා කරන්නේ කොපමණ මුදලක් ද?

(1) රු. 47 000 (2) රු. 48 000 (3) රු. 50 000 (4) රු. 51 000 (5) රු. 52 000

**15.** භවාත් *A* නගරයේ සිට *B* නගරයට මෝටර් රථයකින් යයි. ඔහු ගමනේ මුල් තුනෙන් එක $30\ km\ h^{-1}$ ක මධ්‍යක වේගයෙන් ද ඉතිරි දුර $40\ km\ h^{-1}$ ක මධ්‍යක වේගයෙන් ද රථය පදවයි. *A* සිට *B* තෙක් මුළු ගමනට පැය 4 ක් ගත වේ. *A* සහ *B* අතර දුර කිලෝමීටර කීය ද?

(1) 136 (2) 140 (3) 144 (4) 150 (5) 180

**16.** නිමල් රු. 500 000 ක් ආයෝජනය කර ව්‍යාපාරයක් ආරම්භ කළේය. මාස හතරකට පසු කාදර් රු. 750 000 ක මුදලක් සමඟ ව්‍යාපාරයට හවුල් විය. ව්‍යාපාරය අරඹා අවුරුදු තුනකට පසු ලැබූ ලාභය, එක් එක් පුද්ගලයා යෙදූ මුදල හා කාලය යන දෙකටම සමානුපාතිකව බෙදා ගනු ලැබුයේ නම් නිමල් හා කාදර් ලැබූ ලාභ අතර අනුපාතය කුමක් ද?

(1) 3 : 4 (2) 3 : 5 (3) 4 : 3 (4) 4 : 5 (5) 5 : 3

**17.** ළමයින් 10 දෙනකුගෙන් යුත් කණ්ඩායමක බාලම ළමයාගේ වයස අවුරුදු 8 ක් ද වැඩිමහල්ම ළමයාගේ වයස අවුරුදු 16 ක් ද වේ. මෙම ළමයින්ගේ වයස්වල එකතුව අවුරුදු 120 නම්, අවුරුදු 12 සහ 16 අතර වයස්වල සිටිය හැකි **අඩුම** ළමයින් සංඛ්‍යාව කීය ද?

(1) 0 (2) 1 (3) 2 (4) 3 (5) 4

[තුන්වැනි පිටුව බලන්න.

248302

**18.** සෘජුකෝණාස්‍රයක දිග 25% කින් අඩු කරනු ලබන අතර, එහි පළල 50% කින් වැඩි කරනු ලැබේ. සෘජුකෝණාස්‍රයේ වර්ගඵලයෙහි වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස කොපමණ ද?

(1) 12.5% ක අඩුවීමකි. (2) 12.5% ක වැඩිවීමකි.
(3) 25% ක අඩුවීමකි. (4) 25% ක වැඩිවීමකි.
(5) 30% ක වැඩිවීමකි.

**19.** එක් ඉරිදා උදෑසනක පෙරවරු 6.00 ට ප්‍රනාන්දු මහතා, පසුදින සඳුදා පස්වරු 1.00 ට නාද වන සේ ඔරලෝසුවෙහි සීනුව සකස් කරයි. ඔරලෝසුවෙහි දෝෂයක් පවතින බව ඔහු නොදනියි. ඔරලෝසුව සෑම පැයකටම මිනිත්තු දෙක බැගින් ඒකාකාරීව වැඩියෙන් ක්‍රියාත්මක වෙයි. සඳුදා දින සීනුව නාද වන විට නිවැරදි වේලාව කුමක් වේ ද?

(1) පෙරවරු 11.58 (2) මධ්‍යාහ්න 12.00 (3) පස්වරු 12.02
(4) පස්වරු 12.58 (5) පස්වරු 1.02

**20.** සාමා ඉපදුණේ 2020 පෙබරවාරි 29 වන සෙනසුරාදා දින ය. නැවත ඇගේ උපන්දිනය පෙබරවාරි 29 වන සෙනසුරාදාවක් විය හැකි ආසන්නතම වර්ෂය කුමක් වේ ද?

(1) 2040 (2) 2044 (3) 2048 (4) 2052 (5) 2056

**21.** සමත් ලකුණ 20 වන පරීක්ෂණයකට සිසුහු පස්දෙනෙක් පෙනී සිටියහ. ඔවුන් සියලු දෙනාම පරීක්ෂණය සමත් වූ අතර, ලැබූ ලකුණුවල එකතුව 105 කි. පරීක්ෂණයේ ඉහළම ලකුණ ලැබූ සිසුන් දෙදෙනකුම සිටියේ නම්, එම ඉහළම ලකුණ කුමක් විය හැකි ද?

(1) 22 (2) 23 (3) 24 (4) 25 (5) 26

**22.** කර්මාන්ත ශාලාවකට එක්තරා අයිතමයක් නිපදවීම සඳහා හදිසි ඇණවුමක් ලැබේ. එහි, එම අයිතමය නිපදවිය හැකි $A$, $B$ සහ $C$ නමැති යන්ත්‍ර තුනක් ඇත. $A$ යන්ත්‍රයට මුළු ඇණවුම පැය 4 කදී සම්පූර්ණ කළ හැකි අතර, $B$ හා $C$ යන්ත්‍රවලට පිළිවෙළින් පැය 5කදී හා 6කදී එය කළ හැකි වේ. කර්මාන්තශාලා කළමනාකරු මෙම ඇණවුම සම්පූර්ණ කිරීම සඳහා යන්ත්‍ර තුනම යොදා ගැනීමට තීරණය කරන අතර, ඔහු යන්ත්‍ර තුනම එකම වේලාවකදී ආරම්භ කරවයි. හරියටම පැයකට පසු $B$ යන්ත්‍රය අක්‍රිය වී වැඩකිරීම නවතියි. අනෙක් යන්ත්‍ර දෙක කාර්යය නිම කිරීම සඳහා තව කොපමණ කාලයක් ගනියි ද?


(1) පැයකට මඳක් අඩුවෙන් (2) හරියටම පැයක්
(3) පැයකට මඳක් වැඩියෙන් (4) පැය දෙකකට මඳක් අඩුවෙන්
(5) පැය දෙකකට මඳක් වැඩියෙන්

**23.** රටාව අනුව අවසාන කොටුවේ තිබිය යුතු සංඛ්‍යාව කුමක් ද?

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 5 | 5 | 10 | 30 | 120 | 600 | 3600 | ? |


(1) 22 400 (2) 24 200 (3) 25 200 (4) 25 400 (5) 26 200

**24.** රූපයෙහි දී ඇති පතරොම භාවිත කර නිර්මාණය කළ හැකි ඝනකයෙහි එකිනෙකට ප්‍රතිවිරුද්ධ මුහුණත්වල දැකිය හැකි වන්නේ පහත දැක්වෙන කවර යුගලය ද?




(1) ✶ සහ ○ (2) ✶ සහ □
(3) △ සහ + (4) ◇ සහ □
(5) △ සහ □

**25.**




මෙහි දැක්වෙන පරිදි තල දර්පණයක්, දී ඇති රූපය ඉදිරියෙහි තබා ඇත. එම රූපයෙහි නිවැරදි දර්පණ ප්‍රතිබිම්බය, පහත දී ඇති රූප අතුරෙන් තෝරන්න.



(1) (2) (3) (4) (5)

- අංක **26** සහ **27** ප්‍රශ්න, වර්ෂ 2014 - 2018 කාලය තුළ ශ්‍රී ලංකාවෙහි ආනයන හා අපනයන දත්ත නිරූපණය කෙරෙන, පහත දී ඇති ප්‍රස්තාරය මත පදනම් වේ.




**26.** වර්ෂ 2014 සිට 2018 තෙක් කාලය තුළ අවුරුදු කීයකදී ආනයන අගය, අපනයන අගයෙන් 150% කට වඩා වැඩි විණි ද?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

**27.** 2014 සිට 2018 තෙක් කාලය තුළ ආනයනවල **මධ්‍යක වාර්ෂික වර්ධන ශීඝ්‍රතාව** ආසන්න වශයෙන් කොපමණ ද?

(1) 5% (2) 10% (3) 15% (4) 20% (5) 40%

- අංක **28** සහ **29** ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

අනුර, භානු, කාසිම් සහ ඩේවිඩ් යන ළමයින් සිවුදෙනා නිවසක ඉදිරිපස ගෙවත්තෙහි රබර් බෝලයකින් ක්‍රීඩා කරමින් සිටියදී, එක් අයකු අපරීක්ෂාකාරීව බෝලය විසිකිරීමෙන් නිවසෙහි වීදුරු ජනේලයක් කැඩිණි. ජනේලය කැඩුවේ කවුරුන්දැයි යන්න පිළිබඳව එක් එක් ළමයා කිවූ දේ පහත දැක්වේ.

* අනුර : ඒක කඩපු එක්කෙනා භානු.
* භානු : අනුර කියන්නේ බොරු.
* කාසිම් : ඒක කඩපු එක්කෙනා අනුර.
* ඩේවිඩ් : ඒක කඩපු එක්කෙනා මම නෙමෙයි.

**28.** ළමයින්ගෙන් එක් අයකු පමණක් සත්‍යය ප්‍රකාශ කරයි නම්, වීදුරු ජනේලය කැඩුවේ කවුද?

(1) අනුර (2) භානු (3) ඩේවිඩ්
(4) අනුර හෝ කාසිම් (5) භානු හෝ කාසිම්

**29.** හරියටම ළමයින් දෙදෙනෙක් සත්‍යය ප්‍රකාශ කරත් නම්, වීදුරු ජනේලය කැඩුවේ කවුද?

(1) අනුර (2) භානු (3) කාසිම්
(4) අනුර හෝ කාසිම් (5) භානු හෝ කාසිම්

- අංක **30** සහ **31** ප්‍රශ්න, පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.

රියැදුරෙක් තම වාහනය අධිවේගී මාර්ගයක 150 km දුරක් 90 km $h^{-1}$ ඒකාකාර වේගයෙන් ධාවනය කිරීමට අපේක්ෂා කළේය. ඔහු ඒ අනුව ධාවනය කරමින් සිටිය ද, අතරමගදී අයහපත් මාර්ග තත්ත්ව නිසා 15 km දුරක් 75 km $h^{-1}$ ඒකාකාර වේගයෙන් රිය පැදවීමට සිදු විය.

**30.** රියැදුරා ගමන සඳහා ගත කිරීමට අපේක්ෂා කළ කාලය මිනිත්තු කීය ද?

(1) 72 (2) 90 (3) 100 (4) 120 (5) 160

**31.** වේගය අඩු කිරීම නිසා අපේක්ෂිත කාලයට වඩා මිනිත්තු කීයකින් ගමන ප්‍රමාද වීද?

(1) 1 (2) 2 (3) 3 (4) 4 (5) 5

- අංක **32** සහ **33** යන එක් එක් ප්‍රශ්නයෙහි, එකිනෙකට වෙනස් ද්‍රව්‍ය කිහිපයක එක්තරා ගුණාංගයක් සැසඳීම සඳහා, එම එක් එක් ද්‍රව්‍යය සංකේතයක් මගින් නිරූපණය කර, ඒවා ≤ , = , ≥ ආදී ගණිත සංකේතවල ගුණාංග ඇසුරෙන් ශ්‍රේණිගත කෙරෙන සංයෝජිත ප්‍රකාශයක් බැගින් දී ඇත. අනතුරුව එම ප්‍රකාශයෙන් ලබාගත් නිගමන දෙකක් ද දැක්වෙයි.

  ✱ නිගමනය I පමණක් සත්‍ය නම් *A* තෝරන්න.
  ✱ නිගමනය II පමණක් සත්‍ය නම් *B* තෝරන්න.
  ✱ නිගමනය I හා නිගමනය II දෙකම සත්‍ය නම් *C* තෝරන්න.
  ✱ එක්කෝ නිගමනය I නැතහොත් නිගමනය II පමණක් සත්‍ය නම් *D* තෝරන්න.
  ✱ නිගමනය I හා නිගමනය II යන දෙකින් එකක්වත් සත්‍ය නොවේ නම් *E* තෝරන්න.

**32.** ප්‍රකාශය : ✌ ≤ 👌 ≤ 👍 = 👎 සහ ☜ ≥ ☝ ≥ 👎

නිගමනය I : ✌ < ☜

නිගමනය II : ✌ = ☜

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

**33.** ප්‍රකාශය : ✌ > 👌 ≥ 👍 > 👎 ≥ ☜ සහ 👎 ≤ ☜ ≤ ☝ < ☞

නිගමනය I : 👎 < ☞

නිගමනය II : 👌 > ☝

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

- අංක **34** සහ **35** ප්‍රශ්න, *A*, *B*, *C*, *D*, *E* සහ *F* නම් නගර හයක සාපේක්ෂ පිහිටීම පිළිබඳව පහත දී ඇති විස්තරය මත පදනම් වේ.

  *A* ට කිලෝමීටර 80ක් දකුණෙන් *B* පිහිටයි. *A* හා *B* යා කෙරෙන රේඛාවෙහි හරි මැද *C* පිහිටයි. *A* ට කිලෝමීටර 30ක් බටහිරෙන් *D* පිහිටන අතර, *C* ට බටහිරෙන් *F* පිහිටයි. *F* ට දකුණෙන් ද *B* ට කිලෝමීටර 40ක් බටහිරෙන් ද *E* පිහිටයි.

**34.** *A* නගරයට සාපේක්ෂව *F* නගරය පිහිටන දිශාව කුමක් ද?

(1) උතුර (2) දකුණ (3) වයඹ (4) ගිනිකොන (5) නිරිත

**35.** *C* සහ *D* නගර දෙක අතර සරල රේඛීය දුර කිලෝමීටර කීය ද?

(1) $40\sqrt{2}$ (2) 50 (3) $50\sqrt{2}$ (4) $85\sqrt{2}$ (5) 100

- අංක **36, 37** සහ **38** ප්‍රශ්න, පහත දැක්වෙන විස්තරය මත පදනම් වේ.

  එක්තරා වර්ෂයකදී අ.පො.ස.(උසස් පෙළ) විභාගයේ වාණිජ්‍යය විෂය ධාරාවෙන් දිවයිනේ මුල් ස්ථාන පහ ලැබූ ශිෂ්‍යයෝ පිළිවෙළින් යාපනය, ගාල්ල, කොළඹ, ගම්පහ සහ අම්පාර දිස්ත්‍රික්ක නියෝජනය කළහ. ශිෂ්‍යයින් පස්දෙනාගේ නම්, *A*, *B*, *C*, *D* හා *E* වූ අතර ඔවුන් තෝරාගත් උපාධි පාඨමාලා ගිණුම්කරණ, අලෙවිකරණ, මූල්‍ය, වාණිජ්‍ය හා බැංකුකරණ විය. එහෙත් ඒ අවශ්‍යයෙන්ම එකම අනුපිළිවෙළට නොවේ.

  ✱ පළමු ස්ථානය ලැබූ ශිෂ්‍යයා තෝරා ගත්තේ වාණිජ්‍ය උපාධියකි.
  ✱ බැංකුකරණ උපාධියක් තෝරාගත් ශිෂ්‍යයාගේ ස්ථානය, වාණිජ්‍ය උපාධියක් සහ අලෙවිකරණ උපාධියක් තෝරාගත් ශිෂ්‍යයින්ගේ ස්ථාන අතර විය.
  ✱ පස්වැනි ස්ථානය ලැබූ ශිෂ්‍යයා මූල්‍ය උපාධියක් තෝරා ගත්තේය.
  ✱ ගම්පහ දිස්ත්‍රික්කයේ ශිෂ්‍යයා ගිණුම්කරණ උපාධියක් තෝරා ගත්තේය.
  ✱ *A* ට සහ *D* ට ඇත්තේ එක ළඟ ස්ථාන දෙකකි.
  ✱ *E* තෝරාගෙන තිබුණේ අලෙවිකරණ උපාධියකි.
  ✱ *B* ගේ ස්ථානය *C* ගේත් *E* ගේත් ස්ථාන අතර විය.
  ✱ *D* ගේ දිවයිනේ ස්ථානය 5 විය.

[හයවැනි පිටුව බලන්න.

**36.** ගම්පහ දිස්ත්‍රික්කයේ ශිෂ්‍යයා කවුද?

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

**37.** යාපනය දිස්ත්‍රික්කයේ ශිෂ්‍යයා කවුද?

(1) *A* (2) *B* (3) *C* (4) *D* (5) *E*

**38.** ගාල්ල දිස්ත්‍රික්කයේ ශිෂ්‍යයා ඉගෙනුම සඳහා තෝරා ගෙන තිබූ උපාධිය කුමක් ද?

(1) මූල්‍ය (2) වාණිජ්‍ය (3) අලෙවිකරණ (4) බැංකුකරණ (5) ගිණුම්කරණ

- අංක **39** සහ **40** ප්‍රශ්න, ඉලක්කමක් මගින් එක් එක් ඉංග්‍රීසි අකුර අනන්‍යව නිරූපණය කෙරෙන පරිදි ඉංග්‍රීසි අකුරු නිරූපණය කිරීම සඳහා 0 සිට 9 තෙක් ඉලක්කම් යොදා ගැනෙන කේත ක්‍රම මත පදනම් වේ.

**39.** NORTHWESTERN යන්න කේතනය කිරීම සඳහා පහත දැක්වෙන ඒවා අතුරෙන් කුමක් යොදා ගත හැකි ද?

(1) 654270832846
(2) 654270832146
(3) 654270832946
(4) 654270839846
(5) 654170832946

**40.** පහත දැක්වෙන කුමන පදය, 0832846159323 මගින් කේතනය කළ හැකිවේ ද?

(1) SOUTHEASTERNS
(2) SOUTHWESTERNS
(3) WESTERNHABITS
(4) WESTERNCOASTS
(5) NORTHERNCOAST

- අංක **41** සහ **42** ප්‍රශ්න, එක්තරා රැකියාවක් සඳහා අයදුම්කරුවකු විසින් සපුරාලිය යුතු අවශ්‍යතා මත පදනම් වේ. මෙම අවශ්‍යතා පහත දැක්වෙන කොටුව තුළ ලැයිස්තුගත කර ඇත.

> - **අයදුම්කරුවකු සපුරාලිය යුතු යැයි අපේක්ෂිත අවශ්‍යතා**
>
> 1. 2020 අප්‍රේල් 1 වන දිනට වයස අවුරුදු 20ට වැඩි විය යුතු අතර, අවුරුදු 27 ට නොවැඩි වීම,
>
> **සහ**
>
> 2. අ.පො.ස.(උසස් පෙළ) ගණිත විෂය ධාරාවෙන් අවම වශයෙන් S සාමාර්ථ තුනක් **හෝ** අ.පො.ස.(සාමාන්‍ය පෙළ) ගණිතයට අවම වශයෙන් C සාමාර්ථයක් සමඟ අ.පො.ස.(උසස් පෙළ) වෙනත් ඕනෑම විෂය ධාරාවකින් අවම වශයෙන් C සාමාර්ථ දෙකක් සහ S සාමාර්ථයක් තිබීම,
>
> **සහ**
>
> 3. අ.පො.ස.(සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි සඳහා අවම වශයෙන් C සාමාර්ථයක් තිබීම,
>
> **සහ**
>
> 4. සාමාන්‍ය පොදු පරීක්ෂණයෙන් (CGT) 70 ට වැඩි ලකුණක් තිබීම.
>
> **කෙසේ වෙතත්,**
>
> (i) ඉහත අංක 3 පමණක් හැර අනෙක් සියලු අවශ්‍යතා සපුරාලමින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ.පො.ස.(උසස් පෙළ) විභාගයට පෙනී සිට ඇති අයකු, සමාගමෙහි සාමාන්‍යාධිකාරිගේ එකඟතාව මත තනතුර සඳහා සලකා බැලිය හැකිය.
>
> (ii) ඉහත අංක 4 පමණක් හැර අනෙක් සියලු අවශ්‍යතා සපුරාලමින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් ලබා ඇති අයකු, සමාගමෙහි සභාපතිගේ එකඟතාව මත තනතුර සඳහා සලකා බැලිය හැකිය.

එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති තොරතුරු අනුව,

පුද්ගලයා අයදුම් කිරීමට සුදුසු නම් .......................... *a*
යෝග්‍යතාව තීරණය කිරීමට සපයා ඇති තොරතුරු ප්‍රමාණවත් නොවේ නම් .......... *b*
සලකා බැලීමට සාමාන්‍යාධිකාරිගේ එකඟතාව අවශ්‍ය නම් .......................... *c*
සලකා බැලීමට සභාපතිගේ එකඟතාව අවශ්‍ය නම් .......................... *d*
පුද්ගලයා අයදුම් කිරීමට සුදුසු නොවේ නම් .......................... *e* තෝරන්න.


**41.** 2000 මාර්තු 31 දින උපන් අනුලා, අ.පො.ස.(උසස් පෙළ) විභාගයේදී ව්‍යාපාර අධ්‍යයනය සඳහා C සාමාර්ථයක් ද ආර්ථික විද්‍යාව සඳහා S සාමාර්ථයක් ද ගිණුම්කරණය සඳහා B සාමාර්ථයක් ද සමඟ CGT සඳහා ලකුණු 72 ක් ලබා ඇත. ඇය අ.පො.ස.(සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි සඳහා B සාමාර්ථයක් ලබා ඇත.

(1) *a* (2) *b* (3) *c* (4) *d* (5) *e*

**42.** 1994 මාර්තු 31 දින උපන් බාලා අ.පො.ස.(උසස් පෙළ) විභාගයේදී ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගණිත විෂය ධාරාවට පෙනී සිට B සාමාර්ථ තුනක් සහ CGT සඳහා ලකුණු 75ක් ලබා අනතුරුව ඉංජිනේරු උපාධියක් ලබා ඇත.

(1) *a* (2) *b* (3) *c* (4) *d* (5) *e*

- අංක **43** සහ **44** ප්‍රශ්න, පහත රූපයේ දී ඇති තොරතුරු මත පදනම් වේ. පාසලක අ.පො.ස.(උසස් පෙළ) $A, B$ සහ $C$ යන විෂයයන් ඉගෙන ගන්නා ශිෂ්‍යයන් පිළිවෙළින් ත්‍රිකෝණය, වෘත්තය හා සෘජුකෝණාස්‍රය මගින් නිරූපණය කෙරේ.




**43.** $C$ විෂයය ඉගෙන ගන්නා නමුත් $A$ හෝ $B$ හෝ විෂයයන් **ඉගෙන නොගන්නා** ශිෂ්‍යයෝ කී දෙනෙක් සිටිත් ද?

(1) 10 (2) 20 (3) 30
(4) 40 (5) 50

**44.** $A, B$ සහ $C$ අතුරෙන් විෂයයන් **දෙකක් පමණක්** ඉගෙන ගන්නා ශිෂ්‍යයෝ කී දෙනෙක් සිටිත් ද?

(1) 10 (2) 20 (3) 30
(4) 40 (5) 50

- අංක **45** සහ **46** ප්‍රශ්නවල, 1 සහ 7 වාක්‍ය අතර ඇති $A, B, C, D$ සහ $E$ වාක්‍ය ඇත්තේ නිවැරදි අනුපිළිවෙළින් නොවේ. වාක්‍ය හතෙහි තාර්කික පෙළගැස්වීමක් සඳහා සුදුසු පිළියෙල කිරීම තෝරන්න.

**45.** 1 - ශ්‍රී ලංකාව එහි කොවිඩ්-19 ආර්ථික පුනර්ජීවන වැඩපිළිවෙළෙහි කොටසක් ලෙස සමහර නිෂ්පාදන මත පනවා තිබූ ආනයන සීමා කිරීම් මෑතකදී ඉවත් කළේය.

$A$ - ඊට අමතරව, ආනයන මත යැපීම වැළැක්වීම සඳහා දේශීය සැපයුම් දාමය ශක්තිමත් කිරීමට එය උපකාර කරනු ඇත.

$B$ - "කෘෂිකාර්මික, සේවා සහ ඉදිකිරීම් සම්බන්ධ වාහන හැර මෝටර් සයිකල් හා ත්‍රිරෝද රථ ඇතුළු මෝටර් රථ ආනයනය නැවැත්වීම" මේ පිළිබඳ මාර්ගෝපදේශවල දැක්විණි.

$C$ - මෝටර් රථ ආනයනය කිරීමේ තහනම නොවෙනස්ව පැවතිණි.

$D$ - විදේශ විනිමය අර්බුදයක් හේතුවෙන් නිෂ්පාදන ආනයනය මත පනවන ලද තාවකාලික තහනම මුල්වරට බලාත්මක කරන ලද්දේ මේ අවුරුද්දේ අප්‍රේල් මාසයේදී ය.

$E$ - රටෙහි ආර්ථික පුනර්ජීවන සැලසුම, විනිමය අනුපාතය ස්ථාවර කිරීම ඉලක්ක කරයි.

7 - ආර්ථික පුනර්ජීවන සැලසුමෙහි කොටසක් වශයෙන්, දේශීය නිෂ්පාදන දිරිගැන්වීම සඳහා සමහර භාණ්ඩ මත විශේෂ වෙළඳ බද්ද ඉහළ මට්ටම්වල පවත්වා ගනු ඇත.

(1) $C, D, B, A, E$ (2) $C, D, B, E, A$ (3) $D, B, C, E, A$
(4) $D, C, B, A, E$ (5) $D, C, B, E, A$

**46.** 1 - පොල්, තල් සහ කිතුල් වැනි තාල වර්ගයේ ශාක ශ්‍රී ලංකාවේ වැවෙයි.

$A$ - පොල් වගා කිරීමේ මණ්ඩලය මෑතකදී "වියළි කලාපීය පොල් ත්‍රිකෝණය" නමින් තවත් පොල් ත්‍රිකෝණයක් ප්‍රකාශයට පත් කළේ ය.

$B$ - රටේ සමස්ත පොල් වගා කෙරෙන ප්‍රදේශවලින් 56% ක් වයඹ පළාතෙන් (කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්ක) සහ බස්නාහිර පළාතේ කොටසකින් (ගම්පහ දිස්ත්‍රික්කය) සමන්විත වේ.

$C$ - එය මන්නාරම, මුලතිව් සහ යාපනය දිස්ත්‍රික්කවලට අයත් ප්‍රදේශවලින් සමන්විත වේ.


$D$ - එම ප්‍රදේශය "පොල් ත්‍රිකෝණය" ලෙස හැඳින්වේ.

$E$ - රටේ සියලුම ප්‍රදේශවල පාහේ පොල් දක්නට ලැබුණත්, බස්නාහිර, වයඹ සහ දකුණු පළාත් පොල් වගා කෙරෙන ප්‍රධාන ප්‍රදේශ වේ.

7 - රටෙහි මුළු පොල් වගාව ශීඝ්‍රයෙන් වර්ධනය කිරීම සඳහා එසේ කරන ලදී.

(1) $B, E, D, A, C$ (2) $B, E, D, C, A$ (3) $E, B, D, A, C$
(4) $E, B, D, C, A$ (5) $E, D, B, A, C$

**47.** පහත දැක්වෙන පින්තූර මගින් විස්තර කෙරෙන සිදුවීම සලකා බලන්න.




එම සිදුවීමෙහි නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන්නේ පහත සඳහන් කවර පිළියෙල කිරීම මගින් ද?

(1) *D A C F E B* (2) *D A F C E B* (3) *D A F E C B* (4) *D C A F E B* (5) *D C F A E B*

- අංක **48, 49** සහ **50** ප්‍රශ්න, පහත දැක්වෙන සංවාදය මත පදනම් වේ.

මෙහි *A* සිට *K* තෙක් දැක්වෙන්නේ ස්වාමිපුරුෂයකු ඔහුගේ භාර්යාව රජයේ රෝහලකට ඇතුළත් කිරීම පිණිස හදිසි ගිලන්රථයක සේවාව ලබා ගැනීමට 1990 අංකයට දුරකථනයෙන් ඇමතීමේ සිට ඇය රෝහලේ දැඩි සත්කාර ඒකකයට (ICU) ඇතුළු කර, වෛද්‍යවරයා හමුවන තෙක් කාලය තුළ ඔහු හා අනෙකුත් අය අතර ඇති වූ සංවාදයක කොටසකි. එම සංවාද කොටස් නිවැරදි අනුපිළිවෙළට දී නොමැත.

*A* - ලෙඩාට කථා කරන්න බැහැ. ලෙඩා සමඟ බාහිර රෝගී අංශයට (OPD) ඇවිත් ඉන්නේ කවුද?

*B* - සුබ සන්ධ්‍යාවක්. මේ හදිසි ගිලන්රථ සේවය. ඔබ කථා කරන්නේ කොහේ ඉඳන් ද? අපට ඔබ සඳහා කළ හැක්කේ කුමක් ද?

*C* - ඉක්මනින්ම ප්‍රතිචාර දැක්වූවාට ස්තුතියි. ලෙඩාට ඇවිදින්න බැහැ. ලිපිනය 532, කොළඹ පාර, බෝගහ හන්දිය, පේරාදෙණිය. ඒ බෝගහ හන්දියේ ඉඳන් කොළඹ පැත්තට මීටර 200 ක් දුරින්.

*D* - මම කථා කරන්නේ පේරාදෙණියෙ ඉඳන්. මගේ නෝනට තදින්ම සිහි නැතිවෙලා. එයාට කථා කරන්නවත් ඇවිදින්නවත් බැහැ. මට එයාව පේරාදෙණිය රෝහලට ගෙනියන්න ඔබගේ සේවය ලබාගන්න ඕනෑ.

*E* - දොස්තර මහත්තයා, මම ලෙඩාත් එක්ක ආවේ. එයා මගේ භාර්යාව.

*F* - මහත්මයා පොඩ්ඩක් ඉන්න. අපේ මහනුවර කණ්ඩායම මොහොතකින් ඔබට කථා කරයි.

*G* - මේ තියෙන්නේ සායන වාර්තා පොත. එයා දියවැඩියා රෝගියෙක්. අද දවාලේ පළමුවෙනි සැරේට එයාට පොඩි ක්ලාන්තයක් තිබුණා. ඒත් ඉක්මනටම හොඳ වුණා. එයාට පැයකට ඉස්සර වෙලා හවස 7ට විතර ආයෙත් සිහිනැති වුණා.

*H* - සුබ සන්ධ්‍යාවක් මහත්මයා, මේ මහනුවර හදිසි ගිලන්රථ සේවයෙන්. මට කරුණාකර ඔබේ ලිපිනයයි, ගෙදරට එන විදියයි දැනගන්න පුළුවන් ද? ලෙඩාට ගිලන් රථයට ඇවිදගෙන එන්න පුළුවන්ද කියලත් අපට කියන්න.

*I* - කරුණාකරලා සායන වාර්තා පොත තියෙනවා නම් දෙන්න. ලෙඩාට සිහි නැතිවෙලා කොච්චර වෙලා ද?

*J* - අපි දැන් පරීක්ෂණ වගයක් කරනවා. කරුණාකරලා එළියෙන් ඉන්න. අපි අවශ්‍ය වුනාම ඔයාට කථා කරන්නම්.

*K* - මහත්මයා, ඔයාට ගිලන්රථයේ නළා ශබ්දය ඇහෙනවා ද? කරුණාකර ඔයාගේ ගේට්ටුව ළඟ අපට පේන්න ඉන්න.

**48.** රෝගියාගේ ස්වාමිපුරුෂයා සහ 1990 ගිලන් රථ සේවය අතර සංවාදයෙහි කොටස් කිහිපයක් නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන්නේ පහත දී ඇති කුමන සංයෝජනයෙහි ද?

(1) *B D A C E* (2) *B D A E C* (3) *B D E A C* (4) *B D E C A* (5) *B D F H C*

**49.** රෝගියාගේ ස්වාමිපුරුෂයා සහ දැඩි සත්කාර ඒකකයේ වෛද්‍යවරයා අතර සංවාදයෙහි කොටස් කිහිපයක් නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන්නේ පහත දී ඇති කුමන සංයෝජනයෙහි ද?

(1) *A E I G J* (2) *E I G H J* (3) *F H G I J* (4) *F H J I G* (5) *F I G H J*

**50.** සමස්ත සංවාදයේ වඩාත් තර්කානුකූල පෙළගැස්වීම කුමක් ද?

(1) *A D B C K E F H I G J*
(2) *B D A C K E F I G H J*
(3) *B D A E C K F H J I G*
(4) *B D E A C K F H I G J*
(5) *B D F H C K A E I G J*

* * *

PAST PAPERS WIKI
www.PastPapers.WIKI
Sri Lanka Biggest past papers Bank